ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 මාර්තු 19 සඳුදා
04 වෙළුම - 21 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු: 10.00



## ශු. ජුසේ මුනිඳුන්ගේ මංගල්‍යය

## මාර්තු 19 වැනි සඳුදා

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# දැහැමි බව අරුත් ගැන්වූ සුරැකි පියා.

**ආදරණීය දුවේ පුතේ...**

චතාරික සමය තුළ අපි සාමාන්‍යයෙන් සාන්තුවරයන්ගේ මංගල්‍යයන් පිළිබඳව කථා කරන්නේ නැහැ. නමුත් විශේෂාකාරයෙන් එක් ශුද්ධවරයෙකු පිළිබඳව කථා කරන්නට නම් මේ සමය තුළදී ජන වන්දනාව අපට ආරාධනා කරනවා. ඒ සාන්තුවරයා තමයි, ශුද්ධවූ ජුසේ මුනිතුමා. මාර්තු මාසයේ 19 වන දින අපි මෙතුමාණන්ගේ මංගල්‍යය සමරනවා.

ආදර දුවේ පුතේ,

සාන්ත සභා ඉතිහාසයේ මුල් යුගවලදී කිතුනුවන් ශු. ජුසේ මුනිදුන් ගැන එතරම් අවධානයක් යොමු කලේ නැහැ. එනමුත් 15 වන ශතවර්ෂයේදී ස්විඩනයේ ශු. බ්‍රිජට් තුමිය, ශු. තෙරේසා තුමිය වැනි සාන්තුවරියන්ගේ බලපෑම නිසා ශු. ජුසේ මුනි භක්තිය වර්ධනය වන්නට වුනා. එහි ප්‍රතිඵලයක් වශයෙන් 17 වන ශත වර්ෂයේ මැද භාගයේදී පමණ ජෝශප් නැතිනම් ජුසේ යන නම කිතුනුවන් අතර පොදු නාමයක් බවට පත්වුනා. වර්ෂ 1729 දී දසතුන් වන බෙනඩික්ට් පාප් වහන්සේ ශු. ජුසේ යන නාමය සියළු සාන්තුවරයන්ගේ ප්‍රාර්ථනාවට එක් කලා. වර්ෂ 1870 දෙසැම්බර් 08 වන දින නවවන පියුස් පාප් වහන්සේ ශු. ජුසේ තුමා සමස්ත කිතුනු සභාවේ ආරක්ෂකයා ලෙස ප්‍රකාශයට පත් කලා. ඒ වගේම එම පාප් වහන්සේම ශු. ජුසේ මුනි තුමන්ගේ මංගල්‍යය සාන්ත සභාවේ ඉහළ මංගල්‍යයක් බවට පත් කරනු ලැබුවා. වර්ෂ 1909 දී ජුසේ මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව සාන්ත සභාව උත්තරීතව අනුමත කරනු ලැබුවා.

ආදර දුවේ පුතේ,

ශු. ජුසේතුමා නිහඬව දෙවියන් වහන්සේගේ පණිවිඩය තේරුම් ගෙන ඒ අනුව ජීවත් වූ ශුද්ධවූ තැනැත්තෙක් බව අපි සිහි ගන්වන්නට ඕනා. ශු. ලියවිල්ලෙහි එතුමන්ව හඳුන්වන්නේ ''සත් පුරුෂයෙක්'' කියලායි. තවත් තැනක එතුමන්ව හඳුන්වන්නේ ''ධර්මිෂ්ඨ'' පුද්ගලයෙක් කියලයි. ජීවිතයේ අභියෝග සහ ප්‍රශ්න වලට නිර්භිතව මුහුනදුන් පුද්ගලයෙක් බවත් එතුමන්ගේ දිවිය තුළින් දැකිය හැකියි. ඒ පමණක් නොවේ, දෙවියන්වහන්සේව ඉතාම උසස් ලෙස පිළිගනිමින් දේව හඬ පිළිගත් තැනැත්තෙක් බවටත් සාක්ෂ්‍ය දරනවා. කිසි දිනක පොරොන්දු කඩ කල තැනැත්තෙක් නොවූ ශු. ජුසේ තුමා යුක්ති ගරුකව වචනයේ සැබෑ අරුතින්ම ධර්මිෂ්ඨ පුද්ගලයෙකු සේ ජීවත් වූ බව එතුමන්ගේ ජීවිත ආදර්ශයෙන්ම දැකිය හැකිය.

ආදර දුවේ පුතේ,

ශු. ලූක් තුමාගේ සුවිශේෂයේ සඳහන් වන පරිදි ශු. ජුසේ තුමා ඉතාමත් නීති ගරුක පුද්ගලයෙක් හැටියටත් හඳුන්වන්න පුළුවන්.අධිරාජ්‍යයේ සියළුම වැසියන්ගේ සංගණයක් ගත යුතු යැයි අගුස්තුස් අධිරාජයාගේ නියෝගය පරිදි සියළුම රට වැසියන් ලියා පදිංචි වන පිණිස තම තමන්ගේ නුවර වලට යා යුතු යැයි යන නියෝගය නීති ගරුකව පිළිගත් ශු. ජුසේ මුනිතුමා ගලීලයේ නාසරෙත් තම නුවරින් නික්ම ජුදයාවේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවර බලා ගිය බව ඉතාමත් පැහැදිලිව සුවිශේෂයේ සඳහන් වනවා.

ඒ වගේම මෝසෙස්ගේ ව්‍යවස්ථාව අනුව පවිත්‍ර වීමේ කාලය පැමිණියෙන් හැම කුළුදුල් පිරිමි දරුවෙකුම ස්වාමින් වහන්සේට කැපයයි යන ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාවලියේහි ලියා ඇති ලෙස දරුවා ස්වාමින් වහන්සේට ඔප්පු කරනු පිණිස ජෙරුසලමට ගෙනා බවත් සුවිශේෂයේ සඳහන් වෙනවා. මේ සියල්ල තුළ තේරුම් යන අනිවාර්යය සත්‍ය නම් ශු. ජුසේ මුනිතුමා ඉතාමත්ම නීති ගරුක පුද්ගලයෙක් සේ ජීවත්වූ බව යි. නීති ගරුක වීමත් සත් පුරුෂ භාවයේ නැතිනම් ධර්මිෂ්ඨ කමේ ඉතාමත්ම ඉහළින් පිළිගත් ගුණාංගයක් බව මෙයින් මනාව පැහැදිලි වෙනවා. එතුමාණන් එදා පිළිගත් ජුදා චරිත්‍ර චාරිත්‍ර අගය කලා. එවා සියල්ල පිළිපැද්දා. අවස්ථාවාදී වෙමින් එම නීතිගරුක භාවයෙන් පැන යන්නට එතුමාණන් උත්සහා කළේ නැහැ.

එලෙසම දෙවියන් වහන්සේට ආදරය කල තැනැත්තෙක් හැටියට ඔවුන්වහන්සේගේ සියළු පණිවිඩයන් තේරුම් ගත් හා එහි අර්ථයන් විග්‍රහ කරමින් ජීවිතයෙන් එවා පළිපදින්නටත් එතුමාණන් දැරූ උත්සහය අපට අමතක කරන්න බැහැ. ශුද්ධවූ පවුල මිසර දේශයට රහසින් පලා ගිය අවස්ථාවත් එවන් පණිවිඩයන් මැනවින් තේරුම් ගත් බවට හොඳ උදහරණයක් සේ හඳුන්වන්නට පුළුවන්.

ආදර දුවේ පුතේ,

ශු. බයිබලයේ සඳහන් මෙවන් සිද්ධීන් තුළින් ශු. ජුසේ තුමාගේ චරිතය කොයි ආකාරද යන්න අපට මැනවින් තේරුම් ගන්නට පුළුවන්. එතුමාණන්ගේ චරිතය ඉතාමත්ම නිහඬ චරිතයක්. නමුත් ඒ හා සමානවම එතුමාණන්ගේ චරිතය ඉතාමත්ම බලවත් චරිතයක්. අද අප රටෙත් බොහෝ දේවස්ථාන එතුමාණන්ගේ නාමයට කැප කොට තිබෙනවා. සැබෑ සුරැකි පියෙක් සේ අප රක්නා මෙතුමාණන්ගේ ජීවිත චරිතය මේ ගීතිකාවෙන් මොනවට පැහැදිලි කරනවා.

**ශ්‍රී කන්‍ය මෑණියන්ගේ දම්පත්‍යයා ලෙසේ**
**තෝරා ගනු ලද්දා වූ සන් ජුසේ මුනින්ද්‍රා**

**පාපි දාස රකින සේ සෑම දාම යදිනනේ**

**බිළිඳු ජේසු නාතා ප්‍රේමෙන් දරූ ලෙසේ**
**ආරක්ෂා කෙරුවා වූ සන් ජුසේ මුනින්ද්‍රා**

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ගිරවා



“අයියේ ..... අයියේ...... ඉක්මනට මෙහෙඑන්ඩකෝ ......” මොකටද මට බැහැ .... මම කෝපය මුසු කට හඬින් පැවසීමි. මා එසේ කීවද ඔහුගේ කෑගැසීම නොනැවතුනි. බැරිම තැන කියවමින් සිටි පොත පසෙක තබා ඔහු සිටින දෙසට මම පිය නැගුවෙමි.

“අයිය මාත් එක්ක තරහද ?....... මම ඔයාගෙ වැඩ වලට බාධා කරපු නිසා ....”මල්ලි බයාදු ලෙස මා දෙස බැලුවේය. “ඔව්” කීමට සිත් වුවද ඔහුගේ දුක් බර මුහුණ දුටුවිට එම අදහස සිතතුළම හිරවුනා මිස පිටිතට නොආවේය.

මසිතෙහි ඔහු කෙරෙහි උපන් කරුණාව මම අපහසුවෙන් වචන වලට පෙරළා ගතිමි. “ඇයි මල්ලී මට කථා කළේ...? ”මගේ ඇමතීම කාරුණික යැයි මට සිතිනි.... “අනේ අයියේ ...අර අඹ ගහෙ ගිරවෙක් වහල ඉන්නවා හොඳ අයියා වගේ මට ඌව අල්ලලා දෙනවාද?” මල්ලි නොඉවසිල්ලෙන් කියා ගෙන ගියේය.

“මට ගස් නගින්න දන්නෙ නැති බව ඔයත් දන්නවානේ... අර පොල් කඩන හරමානිස්ටවතත් කියලා බලන්ඩ ...” යැයි පැවසූ මම ගේ තුළට වැදී නැවත පොත කෙරෙහි නෙත් යොමු කළෙමි.

ගතවු විනාඩි පහළොවක කාලයත් සමඟ මල්ලී සිනහා මුසු මුහුණින් මා වෙත දිව ආවේය.

“අයියේ මම ගිරවා අල්ල ගත්තා......” මල්ලිගේ ජයග්‍රාහී කටහඬ ගේ තුළ බිත්ති වල හැපී නැවත නැවත දෝංකාරය නංවන්නට විය. ඔහුගේ මුණ පුරා ප්‍රීතියේ රේඛාවක් විහිදී ඇත.

මල්ලී කොහොමද ගිරවා අල්ල ගත්තේ ....? මම ප්‍රශ්නයක් දැක්වුයෙමි. “මම තිලක් අයියාට කියලා අල්ල ගත්තා....... ” ඔහු කට පුරා සිනා සෙමින් පැවසුවේය. මම නිහඬවීමි. ඉන් ඔබ්බට කථා කළ යුතු දෙයක් නැත්තාසේ මට හැගේ.




මල්ලී ගිරවා පෙට්ටියක දමා ගෙන අම්මා වෙත යනු මම යන්තන් දුටුවෙමි. “කොහෙන්ද බං මේ හදිසියට කූඩු ගන්ඩ සල්ලි ... දැනට අර මයිකල් මාමලගෙ කූඩුවවත් ටිකක් ඉල්ල ගනින්.... කූඩුවක් ගත්තම ආයේ දෙන්න බැරුවැයැ....” අම්මාගේ කඩ හඬ ඈත ලොවකින් ඇසුනාක් සේ මගේ සවනේ ගැටිණි.

මල්ලී කුස්සියෙන් පිටවී දිව යව අඩි ශබ්දය මට පැහැදිළිව ඇසුනි. ඔහු යන්නේ මයිකල් මාමලගෙ පරණ ගිරා කූඩුව ගෙන ඒමට විය යුතුය. මම අපහසුවෙන් හිත ඒකාකාරිකර ගෙන පොත වෙත නෙත් හෙළීමි.....

මයිකල් මාමලගෙ කූඩුව රැගෙන ආ මල්ලී ගිරවා එහි දමා කුඩා දොරටුව අගුළුලා පරාලයක යකඩ කොක්කක් දමා එල්ලනු මම බලා සිටියෙමි ..... පසුව ඔහු කොට තාප්පය උඩ ඉඳගෙන ගිරවා සුරතල් කළේය. මඳ අඳුර පොල් රුප්පාව තුළින් ඉඟි බිඟි පාන්නට වුයේ , හිරු රාස්සමුණ කන්දට මුවාවු පසුවය. මල්ලී තවමත් ගිරා කූඩුව අසලය

“අම්මේ කවුද එනවා..” මල්ලී පැල දොරින් කුස්සියට එබෙමින් අම්මාට පැවසුවේය. අඳුරට බිලිවීයන පරිසරය තුළින් සෙවනැලි දෙකක් ගම්සභා පාර පියමං කර අප නිවස කරා ඇ-දෙයි.......

“ආ හාමු මහත්තයයි පුංචි බේබියිනේ ..... අපිට අඳුනන්නත් බැරිව ගියා එන්න එන්න ඉඳ ගන්න.....”

“බොහොම ස්තුතියි .... ඇසිලින් .... ඉඳගන්න වෙලා නැහැ පොඩි බේබිගෙ ගිරවා අද දවල් ඉගිල්ලිල ගිහින්.... ඉතින් මෙහෙ ඉන්නවයි කියපු ආරංචියක් ආවා ... ඒකයි ආවේ......”

මලිලීගෙ ප්‍රීතියෙන් ඔකඳවී තිබුන මුහුණ අඳුරු වලාවකින් වැසී ගියාක් මෙනි. අම්මාගේ කැමැත්ත ලැබු හාමු මහත්තයා හා පුංචි බේබි ගිරවා රැගෙන අඳුර දෙබෑ කරගෙන යන අයුරු මල්ලී බලා සිටියේ දෙනෙතින් කඳුළු පුරවා ගෙනය. හිස් කූඩුව දෙස බැලු ඔහුට එක විටම හීල්ලිණි.......

**ඒච්.ඒ. විමල් පොන්සේකා**

## කුරුණෑගල හා මල්කඩුවාව දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

ළමුන් අතර ළමා ප්‍රදීපය පුවත්පත ජනප්‍රිය කරවීම හා ළමුන්ගේ සැඟවුණු ලේඛක කුසලතාවයන් ඔප්නංවාලීමේ අරමුණින් යුතුව ලේඛක වැඩමුළුවක් කුරුණෑගල මීසමේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

කුරුණෑගල සා. ආනා දහම් පාසල් ළමුන් හා කුරුණෑගල මීසමට අයත් මල්කඩුවාව පාතිමා දේව මාතා දහම් පාසලේ ළමුන් සඳහා පැවැත්වෙන මෙය 2012 මාර්තු 25 වන ඉරුදින දී කුරුණෑගල හා මල්කඩුවාවේදී දේව මෙහෙයෙන් පසුව පැවැත්වේ. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි.

කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරොම් පෙරේරා පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරේ.

ශානක මුහන්දිරම්

# තල්ගහපිටිය මීසමට අයත් දහම් පාසල් පහක ළමෝ ප්‍රථම වතාවට ලේඛක වැඩමුළුවකට සහභාගීවෙති





කුරුණෑගල පදවියේ තල්ගහපිටිය මීසමට අයත් සියලු සභාවන්හි දහම් පාසල් ළමුන් සඳහා පළමු වතාවට ළමා ලේඛක වැඩමුළුවක් පැවැත්වුණි. තල්ගහපිටිය ශා. ප්‍රැන්සිස් සේවියර් කනිටු විදුහලේ පැවති මෙයට තල්ගහපිටිය ශු. ෆ්‍රැන්සිස් සේවියර්, හිරිගොල්ල ශු. ජපමාල දේව මාතා, කරව්වැව ආරෝග්‍ය දේව මාතා, බිංගිරිය ක්‍රිස්තුරාජ හා වීරකොඩියාන සා. ඌගෝ මුනිඳුන්ගේ දහම් පාසල් ළමුන් සහභාගී වුණි. මෙම ළමා ලේඛක වැඩමුළුව මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි.

මෙයට එක්වූ ළමුන් ට ඉතා සරල අයුරින් ජනසන්නිවේදනය, පුවත්පත්කලාව, හා නිර්මාණකරණය පිළිබඳව දැනුවත් කෙරෙනි. වැඩමුළුව අවසානයේදී ලේඛක අභ්‍යාසයක්ද ලබා දී ඉන් වඩාත් සාර්ථක නිර්මාණයන් ළමා ප්‍රදීපය තුළ පළ කිරීමට අවස්ථාව ලබාදීම ඉතා අගය කොට සැලකිය යුතුය. මෙම වැඩමුළුව සඳහා දහම් පාසල් ගුරුභවතුන්ද එක්ව සිටියහ.

තල්ගහපිටිය මීසම් සේවක ගරු ඇන්ඩෲ ෆෝන්සේකා පියතුමාගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු කේ.ඩී.පයස් මහතාගේ සම්බන්ධීකරණයෙන් මෙම ළමා ලේඛක වැඩමුළුව පැවැත්වුණි. මෙම වැඩමුළුව සාර්ථක කර ගැනීම සඳහා මීසම් සහයක ගරු ගෝමි දිවාකර පියතුමාගේද නොමද සහයක් ලැබුණි. ගරු පියතුමන්ලා දෙදෙනා ළමා වැඩමුළුව ආරම්භයේ සිට අවසානය දක්වාම මෙහි රැඳී සිටීම කැපී පෙනෙන්නකි.

**ජෝශප් නොයෙල්**
**ආචාර්ය මඩුල්ල**
**ශු. ජපමාල දේව මාතා දහම් පාසල - හිරිගොල්ල**

## බෝලවලාන දිසාවේ ධර්මදූත ළමුන්ගෙන් පාදනමස්කාරයක්



ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සිහිපත් කරමින් බෝලවලාන දිසාවේ ධර්මදූත ළමෝ එක්ව පාදනමස්කාරයකට සහභාගී වූහ. මෙයට දිසාව නියෝජනය කරමින් ළමුන් තුන්සියයක් පමණ එක්වූ අතර සජීවක සජීවිකාවෝ රැසක්ද සහභාගී වුණි. සෑම පාදනමස්කාර ස්ථානයක්ම නාට්‍යමය ආකාරයෙන් රඟ දැක්වුණි. බෝලවත්ත දිසා ධර්මදූත අධ්‍යක්ෂ ගරු ගයාන් ප්‍රසන්ත පියතුමාගේ අනුශාසකත්වයෙන් හා මගපෙන්වීම යටතේ දිසා සජීවක සජීවිකාවෝ එක්ව මෙය සංවිධනය කළහ.

**රජිතා වීරසිංහ.**

## අගරදගුරු පදවි දහම් පාසල් ගායනා තරගයෙන් පළමු තැන හල්පේ මීසමේ සිසුවියකට



2011 වසරේ දී කොළඹ අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් සංවිධානය කළ අගරදගුරු පදවි ගායනා තරගයෙන් කටාන, හල්පේ ශා. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසලේ 9 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබනා මානවී සුලක්කනා දැරිය ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත්වූවාය.

ඇය මීගමුව ආවේ මරියා විදුහලේ දීප්තිමත් ශිෂ්‍යාවකි. බාහිර කුසලතාවයන් සඳහා සහජ හැකියාවන් දක්වන ඇයගේ දක්ෂතා අගයා හල්පේ මීසම් සේවක ගරු අමිල ගෝමස් පියතුමන් විසින් විශේෂ තිළිණයක් දේවස්ථාන දහම් පාසල් ත්‍යාග ප්‍රදනෝත්සවයේදී ප්‍රදනය කළේය

**සිසිල් ඩැනීසියස්**

## 2011 වසරේ පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවන්හිදී ලබා දුන් අභ්‍යාසවලින් ජයග්‍රාහී නිර්මාණ නොවූ සාර්ථක නිර්මාණයන්.......

පිපෙන මල් යාය

# උදෑසන අසිරිය



නැගෙනහිරින් හිරු කුමරා එබී බලනවා
නෙළුම් විලේ මල් කැකුළියෝ පිපී නටනවා
රූං රූං මහ හඬ දී බඹරු රඟනවා
උදෑසනක අසිරිය ලෙස අප සිත බඳිනවා

කුරුළු රැන් රැන් පිටින් කෑම සොයනවා
පුංචි පුංචි කුරුළු පැටවු දොරට වඩිනවා
සුදු පිරුවට පුංචි ළමයි පාසල් යනවා
උදෑසනක සිරි අසිරිය මෙලෙස මැවෙනවා

**චමෝදි අශ්මිලා**
10 ශ්‍රේණිය
ශු. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ

# ළමා විය



සිහින අතරින්
මගේ සිනිඳු දෙපා පොඩි
තබයි නුඹ මල් පෙති මත
නිරායාසයෙන් එහෙත් ලබැදියේ
නොසිතන්න මේ සොඳුරු ළමා විය
ගෙවී යන මග නොකියාම ඔබට
ජීවිතයේ ඇති ඉමක් නැති කටුක බව
එහෙත් එම කටුක බව විඳ දරාගනිමින්
ජීවිතය දිනන්ට සිතමු !

**කල්පනා සෙව්වන්දි ප්‍රනාන්දු**
**13 ශ්‍රේණිය**
ජාකොමේ ගොන්සල්වෙස් දහම් පාසල
බෝලවත්ත

# ආදර සමිඳේ



ඔබගේ අත දිගුකරලා
මට හරි මාවත තුළ ගමන්
කිරීමට මඟ පෙන්නුව
මැන සමිඳේ
පුංචි මගේ ජීවිතයේ යා
යුතු මඟ පියමන් කරනට
ඔබගේ අත දුන මැන
සමිඳේ

පුංචි මගේ අඩු පාඩු
ඔබගේ සෙවනේ රැඳෙමින්
හරිගස්වා ගැනීමට
අත දුන මැන සමිඳේ
මා සැමදා ඔබගේ තුරුලේ
රැක ගනු මැන සමිඳේ

**මීරියම් ඩියානා පෙරේරා**
10 ශ්‍රේණිය
ශා. මරියා දහම් පාසල
නයිනමඩම

# සුන්දර මතකය



ඩෙස් බංකු අතරේ
කෙළිලොල්කම් පා
ගත කරන මේ
මගේ පාසල් යමය
සුන්දර වූ මතකයන්
අතීතයට පාවී යාමට
කාලය පැමිණෙමින්
ඇත.
මෙය දැනෙන්නාවූ
මොහොතක
පුංචි හදවතකට
දැනෙනාවූ වේදනාවේ
කඳුළු .....
පිසදැමීමට
යළි හිනහෙන්නට
හැකිනම්
පාසල් මෑණියගේ
තුරලේ සැඟවෙන්නට.......

**සචිනි ලක්ෂිකා**
13 ශ්‍රේණිය (කලා අංශය)
සියලු සාන්තුවරයින්ගේ බාලිකා විද්‍යාලය
බොරැල්ල

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ශුද්ධවූ සභාව තුළ දේව අනාවරණය.

★ **නොවරදින සුළුභාවය යනුවෙන් අදහස් කරන්නේ කුමන් ද?**

- නොවරදින සුළු භාවය යනුවෙන් අදහස් කරන්නේ ධර්මය ( විශ්වාසය) හා සදාචාරය පිළිබඳ කටයුතු ගැන විශ්වාස කිරීමේදීත්, ඉගැන්වීමේදීත් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලබන විශේෂ අනුග්‍රහය හේතු කොටගෙන සභාවට නොවරදින බවයි.

★ **සභාවේ නොවරදින සුළුභාවයට හේතුව කුමක්ද?**

- ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලබන විශේෂ අනුග්‍රහය හේතු කොටගෙන සභාව ආලේප කරනු ලබන පිණිස.

★ **සභාව නොවරදින සුළුභාවය මෙහෙයවා උගන්වන්නේ කුමන අවස්ථාවලදී ද?**

- විශ්වාසය හා සදාචාරය පිළිබඳ සත්‍යතාවයක් මුළු සභාවම විසින් පිළිගත යුතු බවට ප්‍රකාශ කරන අවස්ථාවලදී ය.

★ **සභාව තුළ නොවරදින සුළුභාවය මෙහෙයවන උගන්වන්නේ  කවුරුන් ද?**

- ඉගැන්වීමේ නිල බලයලත් පාප් වහන්සේ
- ඉගැන්වීමේ නිල බලයලත් පාප් වහන්සේ සමඟ සෙසු රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා

★ **පාප් වහන්සේට නොවරදින බව ඇති වග ප්‍රකාශයට පත්කරන ලද්දේ කුමන මන්ත්‍රණ සභාවෙන් ද?**

- 1870 දී පවත්වන පද පළමු වන වතිකාන මන්ත්‍රණ සභාවේදී පාප් වහන්සේට නොවරදින බව ඇති වග ප්‍රකාශයට පත්කරන ලදි.

★ **පාප් වහන්සේ මෙසේ ඉගැන්වීම කුමන නමකින් හඳුන්වයි ද?**

- සිංහාසනයෙන් ප්‍රකාශ කිරීමක්.

★ **ඔබ දන්නා විශ්වාසයේ ධර්මතා දෙකක් නම් කරන්න.**

- 1854 - ix පියුස් පාප් වහන්සේ : දේව මාතාවන් ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳීම සමස්ත කතෝලික ජනතාවම පිළිගත යුතු විශ්වාසයේ සත්‍යතාවයකි.
- 1950 නොවැම්බර් 01 : xii පියුස් පාප්වහන්සේ : මරියෝත්තමාව ආත්ම ශරීරපිටින් සුරලොවට වැඩීම (ස්වර්ගාරෝපණය) සෑම කතෝලිකයකු විසින්ම විශ්වාස කළයුතු සත්‍යතාවයක් බව එතුමා විසින් නිකුත් කළ ''මුනිපිචෙන්ටිස්සිමුස් ඩේයුස්'' නමැති සංදේශ ලිපිය මගින් ප්‍රකාශයට පත්කරන ලදි.

★ **ශුද්ධ වු කතෝලික සභාව දේව අනාවරණය අපට පහදා දෙන්නේ කෙසේ ද?**

- ශුද්ධ ලියවිල්ල
- සම්ප්‍රදාය
- සභා ඉගැන්වීම්

**ඉදිරිපත් කිරීම**
**ගරු ඩේමියන් පෙරේරා**
**පියතුමන් විසිනි.**

★ **දේව අනාවරණය අත් දකින අපගේ ප්‍රතිචාරය කෙබඳු විය යුතුද?**

- අපට ප්‍රකාශ වන දෙවියන් වහන්සේට ශුද්ධාවෙන් යුතුව පිළිතුරු දෙමු.
- ඔවුන් වහන්සේට අපේ බුද්ධිය හා නිදහස් කැමැත්ත පවරා දෙමින් දේව කැමැත්තට අවනත වෙමු.
- සම්පූර්ණ කැමැත්තෙන් දෙවිඳුන්ට සවන් දෙමු.
- දේව වචනය අසා ඒ ගැන විශ්වාසයෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරමු.
- දේව අනාවරණයට අවනතව විශ්වාසයෙන් පිළිතුරු දෙමින්, ගැලවීමේ මාර්ගය උදාකර ගනිමු.
- වගකීමෙන් හා කැපවීමෙන් අපේ කාර්යයන් ඉටු කිරීමෙන් ක්‍රිස්තුවරයාණන් ආදර්ශනය කරමු.

- **ශුද්ධවූ සභාව තුළ දේව අනාවරණය හඳුනාගත් අපි ශ්‍රී ලාංකීය කිතුනු ඇදහිල්ල හා ගමන් මග ලබන සතියේ දී විමසා බලමු.**

අදින් ඇරඹෙන නවතම විශේෂාංගය

# ශු.දොමිනික් සාවියෝ මුනිතුමා



නම : දොමිනිකෝ සාවියෝ

ජීවත් වූ කාල වකවානුව : 1842 අප්‍රි 02 - 1857 මාර්තු 09 දක්වා

ජාතිය : ඉතාලියානු ජාතිකයෙකු

වයස : අවු 14 දී රෝගාතුර වී මිය ගියේය.

මව හා පියා : බ්‍රිජීමා සාවියෝ සහ කාලෝ සාවියෝ

ගම : ටියුනින් නුවර

### ජීවිතයේ සුවිශේෂී තැන්

කුඩා අවදියේ පටන් ම පුංචි දොමිනික් තම මවගෙන් ලත් හුරුව අනුව යාච්ඤාවන් කට පාඩමින් උච්චාරණය කලේය. වයස අවුරුදු 5 දී පූජා උදව් දරුවකු විය. අවුරුදු 7 දී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට තරම් සුදුස්සෙකු විය. ඔහුගේ ආදර්ශ පාඨය වුනේ ''පාපයෙන් හැර මරණයක් ලැබීමය''

දොමිනික් සාමාන්‍ය දරුවකු වුවද අසාමාන්‍ය ආදරයක් දෙවිඳුන්ට පුදකලේය. අවු 12 දී ශු. ජෝන් බොස්කෝ මුනිතුමා පවත්වාගෙන ගිය පාසලට ඇතුලු විය. සම්මුඛ පරීක්ෂණය අවසානයේ තරුණ දොමිනික් තම ගුරු බොස්කෝ තුමාගෙන් ප්‍රශ්නයක් ඇසීය.
''මම ගැන ඔබ මොනවද හිතන්නේ ?''

පිලිතුර නම් : ''මම හිතන්නේ ඔබ අමුද්‍රව්‍යක් කියා''ය.

දොමිනික් ද පිළිතුරක් දුන්නේය. ඒසේනම් ඔබට හොඳ මැහුම්කරුවෙකි. අමුද්‍රව්‍ය හොඳ නම් මාව භාවිතා කරගෙන දෙවිඳුන් ප්‍රසන්න අලුත් ඇඳුමක් මහන්න''.

පාසලේ බොහෝදෙනා දොමිනික් තුල සුවිශේෂී ගතිගුණ දුටුවෝය. ඔහු තරුණ වියේ සිටියත් තම පාසලේ සැමට ආදරය කලේය. මිතුදම් නැති වෙනවාට ඔහු භය වුයේය. මන්ද එය නැතිවීම දෙවිඳුන්ට විරුද්ධ වීමක් සේ ඔහු දුටුවේය. තම යහලුවන්ව විවිධ පාපයන්ගෙන් මුදවා ගන්නට ඔහු නිතරම ක්‍රියා කලේය. තම පාසලට තම ගුරුවරුන්ට ආදරය කිරීමට තමන් හා තම යහලුවන්වත් උනන්දු කලේය. තම යහලුවන්ව පාපොච්චාරණයට යොමු කලේය. දෙව් මැදුරත් සමග තිබුණු බැඳීම නිසා තම සගයන්ටත් ඒ අඩිපාර පෙන්වා දුන්නේය.

වයස අවු: 15 දී එකවරම ඔහු රෝගාතුර විය වැඩි විවේකයට ඔහුව පාසලෙන් නිවසට යවන ලදී නිවසේදී රෝගය වැඩි වී රෝගීන්ගේ ආශිර්වාදයද ලබා ගත්තේය. ඔහු මරණයට බිය නොවීය. ඔහු ස්වර්ගයට යන සිතුවිල්ලක් තුළ ඇඩිව රැදී සිටිමින් සතුටු විය. මරණයට මොහොතකට පෙර ඔහු වාඩි වීමට උත්සහගෙන තම යහපත් පියාට ''ගුඩ් බායි'' කිවේය. ඔහු සිනා සී අවසානයේදි ''මම බොහෝ ලස්සන දේ දැකගතිමි'' කියා ස්වර්ගස්ථ විය.

★ ශු. දොමිනික් සාවියෝ මුනිඳුන්ගේ ජීවිතයේ සුවිශේෂීත්වය

★ මංගල්‍යය දිනය - මාර්තු 09 වෙනිදය

පුංචි ඔබේ ජීවිතයට පාඩමක්

★ තමන් වටේ ඉන්න අය ඔබේ යහලු යෙහෙලියන් කරගන්න ඔවුන්ට ඔබත් හොඳ යහලුවෙක් හොඳ යෙහෙලියක් වන්න.

★ ඔවුන්ගේ හොඳ නම ආරක්ෂා කරන්න. ඊර්ෂ්‍යා නොකරන්න.

★ ඔබත් දෙවිඳුන්ට සමීප වී ඔවුන්වත් දෙවිඳුන් වෙත රැගෙන එන්න.

★ ඔබේ යහලු යෙහෙලියන් ඔබට විරුද්ධ වූ විට ඔවුනට සමාව දෙන්න.

★ ඔවුන්ගේ දුකේදී වේදනාවේදී අසමත් වීම් වලදී හා පරාජය හමුවේදී ඔවුන්ව අත් නොහරින්න.



# සාන්තුවර ජීවිත

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

1. ඔහු ගීතිකා ගයන අයගේ නාම සාන්තුවරයාය.

2. අසාධාරණව වැරදියට අසුවන අයගේත් නාම සාන්තුවරයාය

හේතුව :- ඔහු කිසිවිටකත් තම යහලුවන්ව පාවා දුන්නේ නැත. යහලුවන් වෙනුවෙන් නිහඬ වූ අවස්ථා ඇත. ''ඔහු ජේසුස් වහන්සේව අනුගමනය කරන ලදි. එතුමාණෝ කුරුස ගසේදීත් වද හිංසා වලට පමුණුවන අවස්ථාවේදීත් නිහඬ විය. පාවා දීම හා චෝදනා කිරීම නොකලේය.

# දහම් කැකුළු මල් පිපෙන ක

**ආදර දුවේ පුතේ,**

පසුගිය ලිපියෙන් මම ඔයාලාට කිව්වා අපගේ ජීවිතයෙත් ජේසු නැතිවෙලා නම් ජේසුව හොයාගන්න විදිහක් මම කියලා දෙන්නම් කියලා. ඔබට නැතිවු ජේසුව හොයාගන්න පුළුවන් මෙම චතාරික කාලයේ විවිධ භක්ති අභ්‍යාසයන් කිරීම තුළින්. විශේෂයෙන්ම යාච්ඤාව නිරහාරශිලය හා දන්දීම තුලින්. එම නිසා මම ඔබට කරන්න පුංචි අභ්‍යාසයක් කියලා දෙන්නම්. ඔබට තියෙන්නේ අදාල කොටුවේ ඔබ කරපු භක්ති අභ්‍යාසයේ අංකය සලකුණු කරන්න. මෙම චතාරිත කාලය අවසානයේදි ඔබට අත්දැකීමක් ලැබෙයි කොහොමද මම නැතිවු ජේසුව හොයා ගන්නේ, කොහොමද ඔබ ජේසු තුළ ජීවත් වන්නේ කියා.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පෙබ : 22<br>අළු බදාදා | පෙබ : 23<br>උදා: 1/4 | පෙබ : 24<br>උදා: 2/10 | පෙබ : 25<br>උදා: 3/5 | පෙබ : 26 | පෙබ : 27 | පෙබ : 28 |
| පෙබ : 29 | මාර්තු : 01 | මාර්තු : 02 | මාර්තු : 03 | මාර්තු : 04 | මාර්තු : 05 | මාර්තු : 06 |
| මාර්තු : 07 | මාර්තු : 08 | මාර්තු : 09 | මාර්තු : 10 | මාර්තු : 11 | මාර්තු : 12 | මාර්තු : 13 |
| මාර්තු : 14 | මාර්තු : 15 | මාර්තු : 16 | මාර්තු : 17 | මාර්තු : 18 | මාර්තු : 19 | මාර්තු : 20 |
| මාර්තු : 21 | මාර්තු : 22 | මාර්තු : 23 | මාර්තු : 24 | මාර්තු : 25 | මාර්තු : 26 | මාර්තු : 27 |
| මාර්තු : 28 | මාර්තු : 29 | මාර්තු : 30 | මාර්තු : 31 | අප්‍රියෙල් : 01 | අප්‍රියෙල් : 02 | අප්‍රියෙල් : 03 |
| අප්‍රියෙල් : 04 | අප්‍රියෙල් : 05 | අප්‍රියෙල් : 06 | අප්‍රියෙල් : 07 | අප්‍රියෙල් : 08 | සමිඳුන් සමඟ<br>මගේ චතාරික ගමන<br>2012 | |

# ල්වාරිය නගිමු එන්න.



## පොඩි ෆාදර් ලියයි

ගරු නිරංජන් විජේරත්න (සා. බෙ. නි.) පියතුමා

## 01. යාච්ඤාව

''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගී යාච්ඤා කරන්න'' (ලූක් 22/46)

1. දිනපතා ජපමාලය උච්චාරණය කරන්න.
2. පිබිදුන විට දෙ.ව. ප්‍රශංසා කරමින් දවස අරඹන්න.
3. නිදාගන්න පෙර දවස තුළ ලැබුණ වරප්‍රසාද වලට තුති දෙන්න
4. ඔබ කැමති කෙනෙකු වෙනුවෙන් යාච්ඤා කරන්න.
5. අසමගි පවුල් වෙනුවෙන් යාච්ඤා කරන්න.
6. ඔබගේ පවුලේ අය වෙනුවෙන් යාච්ඤා කරන්න.
7. ඔබට දී ඇති විශේෂ තලෙන්තු වෙනුවෙන් යාච්ඤා කරන්න.
8. අප මීසමේ නොමගගොස් සිටින අය වෙනුවෙන් යාච්ඤා කරන්න.
9. ඉගෙන ගන්න අපහසුකම් ඇති ළමයෙකු වෙනුවෙන් යාච්ඤා කරන්න.
10. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකින්න.
11. දිනපතා බයිබල් පාඨයක් කියවන්න.
12. ඔබට උදව් කරපු කෙනෙකු වෙනුවෙන් යාච්ඤා කරන්න.
13. දේව කැමැත්ත වෙනුවෙන් යාච්ඤා කරන්න.

## 02. නිරාහාරශීලය

''උපමාවෙන්ද, වැලපීමෙන්ද මුළු සිතින් දරුවන් මා වෙත එවන්න''

(ජොවෙල් 2/12)

1. ඔබ කැමති ප්‍රිය දෙයකින් වැලකී සිටින්න.
2. මිතුරෙකු සමග පාදනමස්කාරයන් කරන්න.
3. පාපොච්චාරණය නැමති සක්‍රමෙන්තුව ලබා ගන්න.
4. වැඩිපුර රූපවාහිනිය බැලීමෙන් වලකින්න..
5. අනවශ්‍යය කතා වලින් වැලකි සිටින්න.
6. දෙමාපියන්ට උදව් කරන්න.
7. පවුලක් ලෙස දිව්‍ය පූජාවට සහභාගීවන්න.
8. ඔබට වැඩිපුර ඇති යමක් නැති කෙනෙකුට දෙන්න.
9. තරහා ගිය විට නිහඬව සිටින්න.
10. ඔබගේ යම් අඩුපාඩුවක් මගහරවා ගන්න උත්සහ දරන්න.
11. දිනපතා ජපමාලය උච්චාරණය කරන්න.
12. කැන්ටිමෙන් කන කෑම ප්‍රමාණය අඩුකර එම මුදල් කැටයට දමන්න.

## 03. දන්දීම

''ඔබ දන්දෙන කළ දකුණත කරන දෙය වමතට නොදැනේවා''

මතෙව් 6/3

1. පවුලක් ලෙස අසනීප කෙනෙකු බැහැදකින්න යන්න.
2. වැඩි භක්තියකින් දිව්‍ය පූජාවට සහභාගී වන්න.
3. රූපවාහිනිය නරඹන ප්‍රමාණය අඩුකර ඒ කාලය වෙන දෙයකට යොමු කරන්න.
4. දුර්වල ළමයෙකුට පාඩම් කියා දෙන්න.
5. දිව්‍ය පූජාවට එන්නේ නැති කෙනෙකුට එහි වටිනාකම කියලා දෙන්න .
6. දහම් පාසල් එන්නේ නැති දරුවෙක් දහම් පාසල් එක් කරගෙන එන්න
7. ගෙදර දොරේ වැඩක් කැපවීමෙන් කරන්න.
8. වරදක් කල කෙනෙකුගෙන් සමාව ඉල්ලන්න.
9. දුක්විඳින කෙනෙකු වෙනුවෙන් යාච්ඤා කරන්න.
10. බොරු සෝබන වැඩවලට යොදවන මුදල් එකතු කරන්න
11. පැනි රස කන්න වියදම් කරන මුදල්වලින් තව කෙනෙකුට උදව් කරන්න .

ඉතිං ආදර දුවේ පුතේ, නොඃ 1,2,3, යටතේ ඇති ඕනෑම අභ්‍යාසයක් තෝරා නියමිත දිනට වෙන්වූ කොටුවේ ලකුණු කරන්න.

උදා :- 1/4, 2/10, 3/2 ආදී වශයෙන්.

මෙම චතාරික කාලය තුළ මෙම අභ්‍යාසය අවංකව උනන්දුවෙන් කිරීම තුළින් ඔබට ජේසු වෙතට ලංවෙන්නට අවකාශය සැලසෙනවා. ජේසු වෙනුවෙන් මම කරන මේ මගේ චතාරික ගමන ලෙස මෙයට සහභාගී වන්න. එවිට ඔබට ඔබේ නැතිවූ ජේසු හමුවෙවි !. ඔබට ජේසු පිහිටයි.



# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ලමා ප්‍රදීපය

ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි. පාඩම් අංක : 47

## Either / Neither

There are two books - පොත් දෙකක් තිබුණා
Either of them is interesting - ඉන් කොයි එකත් රසවත්.

**Either** කියන සහ **Niether** කියන වචන, ඒක වචන වරිනාකමක් ඇති වචන. බව මතක තබාගන්න. එයට ඒක වචන ක්‍රියාවක් යෙදිය යුතු නමුත් ඇතැම් අවස්ථාවලදී එය බහු වචනයක් ලෙස භාවිතා වන බවත් මතක තබා ගන්න.

**නිදසුන් :-**

Neither of these two books ***is good.***
Neither of these two books ***are good***. මේ දෙකම හරි

Neither of the children want to play.
Neither of the children wants to play. මේ දෙකම නිවැරදියි.
එත Neither පමණක් එක්ක නාම පදයක් යෙදුනත් එය ඒක වචන ස්වරූපය ගෙන තැබිය යුතුයි.

**නිදසුන්:**

Neither book ***was*** interesting. මේ පොත් එකක්වත් රසවත් නෑ.
Neither child ***has*** passed the exam. ළමයි දෙන්නගෙන් එක්කෙනෙක් වත් විභාගෙ පාස් නෑ.

You can buy either a pen or a shirt with this money.
ඔබට පෑනක් හරි කමිසයක් හරි ගන්න පුළුවන් මේ සල්ලි වලින්.
There are two hotels. හෝටල් දෙකක් තියෙනවා.
We can go to either. අපිට ඕනම එකෙට යන්න පුළුවන්.
Either is good. ඒ කෝකත් හොඳයි.

There are two guitars. ගිටාර් දෙකක් තියෙනවා.
One is green and the other is yellow. එකක් කොළපාටයි. අනික කහ පාටයි.

You can buy either the green guitar or the yellow guitar.
ඔබට කොළ පාට ගිටාරය හෝ කහ පාට ගිටාරය මිලදී ගත හැකියි.

Either is good. ඒ කෝකත් හොඳයි.
You can buy either. කෝක හරි ඔබට ගන්න පුළුවන්.

I like neither the green guitar nor the yellow guitar.
මම කොළපාට ගිටාරයටවත් කහපාට ගිටාරයටවත් කැමති නෑ.
මෙවැනි වැකියකදී neither .... nor යන වචන අත්‍යවශ්‍යම වෙනවා.

I like neither. මම එකකටවත් කැමති නෑ

Neither is beautiful. එකක්වත් ලස්සන නෑ.

I like neither N'eliya nor Bandarawela.
මම නුවරඑළියටවත් බණ්ඩාරවෙලටවත් කැමති නෑ.

I like neither. මම ඒ කෝකටවත් කැමති නෑ.

I like neither Sunil nor Anil
මම සුනිල්ටවත් අනිල්ටවත් කැමති නෑ.

Both are lazy. දෙන්නම කම්මැලියි.

Either is lazy. (එක්එක්කෙනා තනි වශයෙන් ගත්තම කොයි කෙනත් කම්මැලියි)

I do not like either Sunil or Anil.
මම සුනිල්ටවත් අනිල්ටවත් කැමති නෑ.

මම දෙන්නාටම කැමති නෑ කියන අදහසම තමයි මේ වැකියෙනුත් කියැවෙන්නේ.

**Both, Either, Neither** යන වචන යෙදීම පිළිබඳව. වඩා දැනුවත් වෙමු.

බයිබලය යනු කතෝලික ජනතාවගේ සුවිශේෂී ආගමික ග්‍රන්ථයයි. මේ බයිබලය මහ පුස්තකයක් හෙයින් ළමා පරපුරට ''ළමා බයිබලය'' මැයෙන් වඩාත් සරල බසින් හොඳින් තේරුම් ගත හැකි මට්ටමේ බයිබල් පාඨ එකතුවක් මේ ග්‍රන්ථය මගින් ඉදිරිපත් කර තිබේ.

**කිතුනු ළමා පරපුරට බයිබලය හුරු කරවීමට ළමා බයිබලය කදිම මෙවලමකි. ළමා වියේදී ළමා බයිබලය ඔස්සේ බයිබලය පරිශිලනය කිරීමට හුරුපුරුදු කරවීම මගින් වැඩි විය පත් කල තරුණ හා වැඩිහිටියන් ලෙසද බයිබලය ඔවුනට ආගන්තුක ග්‍රන්ථයක් බවට පත්වන්නේ නැත.**

# ළමා බයිබලය




ජේකබ් එකර්
පරිවර්තනය - අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි

මෛත්‍රී විසිනි




**ඔබත් සොයාගෙන කියවන්න**

කොළඹ විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් මීට විසි අට වසරකට පෙර පරිවර්තනය කළ මේ ග්‍රන්ථය එදට මෙන් අදටත් එකසේ වැදගත්ය. පැරණි ගිවිසුමේ මැවීමේ පටන් නව ගිවිසුමේ ශුද්ධාත්මයාණන් වහන්සේ ලබා ගැනීම දක්වා විවිධ සිද්ධීන් 72 ක් ඉතාමත් සරලව , සුගමව කතාවක් කියන ආකාරයෙන් මේ ග්‍රන්ථයට ඇතුළත් කර ඇත.

එහෙත් ඒ නිසාම ඒවායේ සුවිශේෂී දේව වචනයේ වටිනාකම දුබල නොවනු සඳහා වඩාත් කල්පනාකාරී ලෙස බස හසුරුවා ඇත. මේ සිද්ධීන් 72න් 28 ක් පැරණි ගිවිසුම ඇසුරින්ද සිද්දීන් 44 ක් නව ගිවිසුම ඇසුරින්ද ඉදිරිපත් කර ඇත. සෑම කතාංගයක් සමගම අලංකාර වෛවර්ණ චිත්‍රයකින් කතාවේ අරුත පරිපූර්ණ කිරීමට ගත් වෑයම අගනේය. මෙලෙසින් ළමා පරපුර චිත්‍ර ඇසුරින් අධ්‍යාපනය ලබන්නට දක්වන උනන්දුව හා ඉන් ලබන සාර්ථකත්වය තේරුම් ගෙන කතුවරයා මේ චිත්‍ර ඇතුළත් කර ඇති බැව් පෙනේ.

කිතුනු ළමා පරපුරට බයිබලය හුරු කරවීමට ළමා බයිබලය කදිම මෙවලමකි. ළමා වියේදී ළමා බයිබලය ඔස්සේ බයිබලය පරිශිලනය කිරීමට හුරුපුරුදු කරවීම මගින් වැඩි විය පත් කල තරුණ හා වැඩිහිටියන් ලෙසද බයිබලය ඔවුනට ආගන්තුක ග්‍රන්ථයක් බවට පත්වන්නේ නැත.

එමෙන්ම නූතන කතෝලික ළමා පරපුරට පරිශීලනය සඳහා හරවත්, ගුණාත්මක පතපොත නැතැයි මැසිවිලි නැගෙන සමයක ඊට කදිම පිළිතුරක් සෑම දූ දරුවකු අතට නොබියව ලබාදිය හැකි ආගමික පුස්තකයක් ලෙස ළමා බයිබලය අපට නොබියව හඳුන්වා දිය හැකිය.

ඒ නිසාම ළමා පරපුරට මෙන්ම යොවුන් හා තරුණ පරපුරට ද පරිශීලනය සඳහා ළමා බයිබලය වඩාත් වැදගත් කාලීන වටිනා කමක් සහිත සුපුවතකි. ඔබේ දරුවාටත් ළමා බයිබලය කියවන්න ලබා දීමට තව තවත් පසුබට නොවන්න.

**ළමා ප්‍රදීපය පාස්කු කලාපයට නිර්මාණ එවන්න.**

**ළමා ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය සඳහා පාස්කුව හා බැඳි ඔබගේ නිර්මාණ ( සැදැස්, නිසැදැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ මාර්තු 26 වන දිනට පෙර,**

**ළමා ප්‍රදීපය "පාස්කු කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.**

**සංස්කාරක පියතුමා**

# දෙවිඳුන් මැවු ලොවෙහි අසිරිය



**ඩිමාෂ් කවිශ්ක**
07 ශ්‍රේණිය
සා. ජෝසප් ශාඛා විදුහල - මීගමුව



**ලක්ෂාණි මධුෂිකා දිසානායක**
06 ශ්‍රේණිය
සා. සෙබස්තියන් විදුහල - කටුනේරිය

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**සඳලි කාවින්ද්‍යා සමරතුංග**
08 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල
ගම්පහ



**රශ්මි ඉමල්ෂා ප්‍රනාන්දු**
06 ශ්‍රේණිය
කාර්මේල් බාලිකා
ම.ම.වි. - හලාවත

**ෂෙහාරා බටුවිටගේ**
10 ශ්‍රේණිය
සියලු සාන්තුවරයන්ගේ
බ.ම.වි. - බොරැල්ල



**ස්වේන් දේදුණු ප්‍රසංසා**
01 ශ්‍රේණිය
නිමල මරියා
බාලිකා විදුහල
තුඩැල්ල





**සඳලි අනුත්තරා**
04 ශ්‍රේණිය
සා. මරියා
ප්‍රථමික
බලිකා විදුහල
හලාවත



**කුෂ්ලානි මධුෂිකා රත්නායක**
08 ශ්‍රේණිය
ආවේ මරිය ශාඛා
පාසල
අක්කරපනහ
මීගමුව




*මා කුඩා අවදියේ සිට දහම් පාසල තුළින් ජීවිතය ගොඩ නගා ගත් ආකාරයත් ඒ තුළින් මාගේ ජීවිතය සමාජයීය ලෙස හා ආධ්‍යාත්මික ලෙස වර්ධනය කර ගත් ආකාරය පිළිබඳවත් ළමා ප්‍රදීපයට ලියන්නට මා හට ලැබුණු මහගු අවස්ථාව වෙනුවෙන් ළමා ප්‍රදීපයේ කර්තෘ මණ්ඩලයට ස්තුති වන්ත වෙමි.*

දහම් පාසල් අවධිය පිළිබඳව යමකු මගෙන් විමසු විට මගේ මතකය ක්‍ෂණයකින් යන්නේ 1985 - 1986 කාල පරිච්ඡේදය වෙතයි. ඒ කාලය දහම් පාසල් ජීවිතය ස්වර්ණමය යුගයක් ලෙස අදටත් මගේ ජීවිතයේ සනිටුහන් වී තිබෙන්නේ කිසිදා නොමැකෙන කාල පරාසයක් ලෙසිනි. ඊට ප්‍රධානතම



හේතුව මෙම කාල පරිච්ඡේදයේ අප මීසමේ මීසම් සහයක ලෙස කටයුතු කල ගරු එගටන් ඩිලයිල පියතුමායි. අද උන්වහන්සේ අප අතර නැතිය. උන්වහන්සේ සවර්ගස්ථ වී සිටී. දහම් පාසල් තුළ උන්වහන්සේ නිරන්තයෙන්ම අපගේ ජීවිතයට දුන් අධ්‍යාත්මික පණිවුඩය සහ ඒ හා සමග බැදුණු සුවිශේෂ පාඨය අදටත් මගේ ජීවිතයේ සහ මනසේ ලියැවී තිබේ. එය මා කියන්නේ කට පාඩමිනි.

“ උන්වහන්සේ ගලීලයේ මුහුදු බඩ ඇවිදින විට , පේදුරු නම් ලත් සීමොන්ද ඔහුගේ සොහොයුරු ඇන්ඩෲ ද මුහුදේ දැලක් හෙළනු දුටු සේක. ඒ දැක මා අනුව එන්න මම නුඹ මිනිසුන් දිනන්නන් කරන්නෙමියි වදාළ සේක. එකෙනෙහිම ඔවුහු දැල් අත්හැර දමා උන්වහන්සේ අනුව ගියහ”

ගරු පියතුමන් මෙමගින් අපට දුන් උදාර පණිවුඩය අදටත් මා මනසෙහි තැන්පත් වී තිබේ. නිරන්තරයෙන්ම අප ඉටු කළ යුත්තේ දේව කැමැත්තයි. ක්‍රිස්තුන් වහන්සේ කළ ආරාධනයට එදා ධීවරයින් ක්‍ෂණික ප්‍රතිචාර දැක්වූ ආකාරය සුවිශේෂය මනාව පැහැදිලි කරයි. ඒ ධීවරයින් අතරින් එකදු ධීවරයෙක් හෝ මම ගෙදර ගොස් මගේ බිරිඳට හෝ දරුවන්ට සල්ලි දී හෝ අල්ලාගත් මාළු ටික ලබාදී එන්නම් යනුවෙන් ආදි වශයෙන් කෙදිරි ගැවේ ද නැත. “සියල්ල අතහැර දමා උන් වහන්සේ අනුව ගියහ” යනුවෙන් සුවිශේෂයේ සඳහන්ය. ධීවරයන් සතුව තිබු මාළු, දැල් , බෝට්ටු , එන්ජින් සහ අනෙකුත් ආම්පන්න විශාල මිල ගණන්ය. ඒවා අදටත් අධික මිලක් වේ “සියල්ල අතහැරදමා උන්වහන්සේ අනුව ගියහ”. යනුවෙන් අදහස් කරන්නේ ධීවරයන්ගේ ජීවිතය පවා අතහැර දැමීමයි. එසේනම් අප අපගේ සමාජය තුළ දේව රාජ්‍යය ගොඩ නැගීමට නම් පෞද්ගලීකව මා කුමක් අතහැරීමට සුදානම්ද ? එවකට මා ධර්මදූත ළමා සමාජයේ සජීවකයෙකු ලෙස කටයුතු කළ කාලයේද ධර්මදූත ළමුන් වෙත දුන් පණිවුඩයද එයයි. දේව රාජ්‍යය ගොඩ නැගීමට නම් මගේ ලෞකික ආශාවන්ගෙන් ඉවත්විය යුතුයි.

එවකට ගරු එගටන් ඩිලයිල පියතුමන් දුන් පණිවුඩයට වර්තමානයේ අදටත් මම මගේ ජීවිතයෙන් ප්‍රතිචාර දක්වන බව පසක් කරමි. ලෞකික වශයෙන් වැදගත් හෝ වටිනාමය යැයි කියන බොහෝ දේ දේව රාජ්‍ය ගොඩ නැගීමේ කාර්යය නිසා මා ඉවතලමි. ඔබට ජේසු පිහිටයි.

**රුක්මාල් සිල්වා**

ගුරු මණ්ඩල සම්බන්ධීකාරක

ශාන්ත මරියා දහම් පාසල - මට්ටක්කුලිය



**මාසික සිතිවිල්ල**

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

**මාසික සිතිවිල්ල**

“මාර්තු මාසය”

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# සමිඳු සෙවනට ගිය පියතුමෙනි



(වසර 22 අප මීසමෙහි (බටගම) සේවය කළ, පසුගිය ද ස්වර්ගස්ථවූ ගරු ෆර්නැන්ඩ් මොයිස් පියතුමාට උපහාරයකි )

මනීෂා දෙව්මිණි
8 ශ්‍රේණිය
සදාසරණ මාතා ධර්මදූත ළමා සමාජය - බටගම මීසම

බටගම පල්ලිය එළිය කළේ මොයිස් පියතුමා
අපේ සිත් සතුටු කළේ මොයිස් පියතුමා
සැම විට නිර්භීතව හිටි මොයිස් පියතුමා
කරදර වලට මුහුණ දුන් මොයිස් පියතුමා

අසරණයින්ට, දුප්පතුන්ට පිහිටවන්නේ
දේව වචනෙ සැම දෙනාට උගන්වන්නේ
දෙවිඳුන් ගැන විශ්වාසයෙන් දිවිගෙවන්නේ
ඔබගේ වැරදි නෑ කිසිවිටකත් අපි දකින්නේ

ජීවිතය සැමදා ජයගත් පියතුමෙනි
ඔබගේ ගුණ කියා නිම කළ නොහැකිනි
මගෙ සිතේ සැම දාටම ඔබ සිටින්නෙමි
සද සාමය දිනේවා ඔබ, මොයිස් පියතුමෙනි

# මලල ක්‍රීඩා ශූරියක්



මීගමුව, අක්කරපනහා ආවේ මරියා (ශාඛා) විදුහලේ 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජේ.ඒ. අරෝෂා නෙත්මි ශිෂ්‍යාව මෙවර පැවැති පාසල් මලල ක්‍රීඩා උළෙලෙදී වයස අවුරුදු 10 න් පහළ අභියෝගතා කුසලානය දෙවනි වරටත් හිමිකර ගත්තාය.

මේ සඳහා ඇය මීටර් 100, මීටර් 50 දුර පැනීම හා 100×4 - 50×4 කඩින් කඩ දිවීම ආදි තරග ඉසව්වලින් ප්‍රථම ස්ථානය හිමිකර ගත්තාය. අරෝෂා නෙත්මි ජාඇල මා එළිය සා. රීතා දහම් පාසලේ ශිෂ්‍යාවකි.

බෙන්ජමින් කිරිහෙට්ටි

## අපේ පල්ලිය



අපේ පල්ලිය නායකකන්ද පල්ලියයි. එය ජේසු අම්මාටයි කැප කරලා තියෙන්නේ. අපේ පල්ලියේ 150 ජුබිලි මංගල්ලය හොඳට තිබුණා. ඒකට ගොඩක් සෙනඟ ආවා.

මම මගේ පල්ලියටත්, දහම් පාසලටත් ගොඩාක් ආදරෙයි. ජේසු අම්මා මට හැමදාමත් ආශිර්වාද කරනවා.

ඉමැක්‍යුලා ආදිත්‍යානි පයස්
2 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - නායකකන්ද

**ස්වාධීන රූපවාහිනියේ 'සුදත් මඟ' කිතුනු වැඩසටහනට හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (ස්වදේශී සේවය) "කිතුනු ළමා හමුව" ට නිර්මාණ යොමුකරන්නට ළමා ඔබටත් අවස්ථාවක් !**

**ළමා ඔබගේ නිර්මාණයන්** ඔබේ නම, ශ්‍රේණිය, පාසල, දහම් පාසල, දුරකතන අංකය ඔබ අයත් මීසම, පදවිය ආදි තොරතුරුද ඇතුලත් කර **පහත ලිපිනයට යොමු කරන්න.**

**ළමා ප්‍රදීපය "සුදත් මඟ"**
**ළමා නිර්මාණ අංශය**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**

**"කිතුනු ළමා හමුව"**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**
**කොළඹ 07.**

සංස්කාරක පියතුමා

# ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ සියවස් සැමරුම් දේව මෙහෙය

ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ සියවස් සැමරුම් දේව මෙහෙය පසුගිය ද කොටහේන සා. ලුසියා ආසන දෙව්මැදුරේ දී කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මනුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

කොළඹ හා ඒ අවට පාසල්වල බාලදක්ෂයින් පන්සීයකට අධික ප්‍රමාණයක් එම දේව මෙහෙයට සහභාගී විය. මම, 21 වන කොළඹ බාලදක්ෂ කණ්ඩායම නියෝජනය කරමින් දිව්‍ය පූජාවට සහභාගී වුණේ නවක බාලදක්ෂයෙක් ලෙසය. මට එය මහත් අත්දැකීමක් විය.

දේව මෙහෙයේදී රදගුරු හිමිපාණන් දුන් අවවාදයට අනුව මමත් බාලදක්ෂ ව්‍යාපාරය තුළින් අනාගතයේ හොඳ පුරවැසියෙකු වීමට අදිටන් කර ගතිමි.

**පසන්ජිත් අභිලාෂ් පයස්**
**6 ශ්‍රේණිය**
**සාන්ත ජෝශප් විදුහල - මරදන**

## රත්මලාන දහම් ළමුන්ගේ ක්‍රීඩා උත්සවය



රත්මලාන මීසමේ දහම් පාසලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය රත්මලාන මීසම් සේවක ගරු රොෂාන් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියද පැවැත්විනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**ප්‍රේමා හීනටිගල**

## ප්‍රහේලිකා අංක 29



**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

### හරහට

1. අධෛර්යවත් නොවී නොකඩවා යාච්ඤා කළයුතු බව දක්වන පිණිස ක්‍රිස්තුන් වහන්සේ, ........ හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය
4. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වීමට පෙර මධ්‍යහන වේලාවේදී රටපුරා අන්ධකාරයක් පහළ වී එය ..... තුන දක්වා පැතිරුණු බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය
5. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගසන ලද කුරුසිය මුදුනේ ''ජුදෙව්වරුන්ගේ ....... මොහුය'' කියා ලියන ලද පුවරුවක් එල්ලා තිබිනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. යම් මිනිසෙකුගේ මෙය තුළින් ඔහුව හඳුනාගත හැකි අයුරු උපදේශකයා හෙවත් සිරාක් විස්තර කරයි.
9. ක්‍රිස්තුන් වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක ඇණ ගසා තිබු තැන්වල ඇඟිල්ල තබා බලනතුරු ක්‍රිස්තු උත්ථානය මෙසේ කිරීමට තෝමස් ශ්‍රාවකයා මැලිවිය.

### පහළට

1. අහසින් වැටෙන හිම හා වසින ..... නැවත හැරී නොගොස් පොළොව සරුසාරකර මිනිසාට ආහාර දෙනසේ දේව වචනය හිස්ව හැරී නොගොස් අදහස් ඉටුකරන බව යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. හිස්තැනට සුදුසු වචනය

2. පුප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යයේ රොටී අනුබව කල පුරුෂයින් පමණක් පන් ...... වු බව ශු. බයිබලයේ සඳහාන් වෙයි. හිස්තැනට සුදුසු වචනය.

3. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රථම ප්‍රාතිහාර්යයේදී උන්වහන්සේ මේවා වයින් බවට හැරවු සේක.

06. ...... හා මරණය සිහිකර විශ්වාසවන්ත ලෙස පණත් ඉටු කරන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. හිස්තැනට සුදුසු වචනය

07. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අසා පිළිපදින අය .....ශක්තිමත් අත්තිවාරමක් මත ගෙයක් ගොඩනැගූ මිනිසෙකුට සමාන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

08. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගැසීමට පෙර මේවා වලින් පහරදුන් බව ශු. බයිබලයේ සඳහන් වේ.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 18,23,7, පරිච්ඡේද ශු. මාක් 6, ශු. ජුවාම් 2,20, යෙසායා 55 උපදේශකයා හෙවත් සිරාක් 28, 27/4-7)

**ප්‍රහේලිකා අංක 29 සඳහා පිළිතුරු ලබන සතියේ**

ශුද්ධ ලියවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

තෙවන කොටස

# දිවැසිවර එලියා

සැකසුම : තිළිණ අලහකෝන්

